# සාම කතා බටහිරයන් සහ ජාතික බලවේග

කොටි සංවිධානය ඊනියා සාම සාකච්ඡා සඳහා අතීතයේදී එකඟවී ඇත්තේත් වර්තමානයේදී එකඟ වන්නේත් එකම එක කරුණක් නිසා පමණකි. ඒ ඔවුන්ට සටන් කර ඊළමක් දිනා ගැනීමට නොහැකි බැවින්ය. සටන්කර ඊළමක් දිනා ගැනීමට හැකි කමක් තිබුණි නම් කොටි ත්‍රස්තවාදීන් සාකච්ඡා කිරීමට නොපෙළෙඹෙනු ඇත. අද ඔවුන් උත්සාහ කරන්නේ සටන් කර දිනාගත නොහැකි ඊළම සාකච්ඡාවෙන් ලබා ගැනීමටය. එහිදී ඔවුන්ට ආධාරයට සිටින්නේ බටහිර ක්‍රිස්තියානි රටවල්ය. මේ රටවලට බටහිර ක්‍රිස්තියානි යැයි කියන්නේ එයට සුදුසුම නම ඒ බැවින්ය. ඔවුන්ගේ දේශපාලන විද්‍යාඥයන් අප රැවටීම සඳහා කුමක් කීවද, ඒ රටවල රාජ්‍ය ක්‍රිස්තියානි වෙයි. එහි සංස්කෘතිය ක්‍රිස්තියානි වෙයි. ඒ රටවල් විසින් බිහිකෙරෙන දැනුම ක්‍රිස්තියානි වෙයි. අනාගමික බහු සංස්කෘතික රාජ්‍යයක නිර්මාණය කෙරෙන වාස්තවික දැනුමක් ගැන කතා කිරීමෙන් බටහිර බුද්ධිමතුන් කරන්නේ අප මුළා කිරීම පමණකි. තමන්ට සටන්කර ඊළමක් දිනා ගැනීමට නොහැකි බව කොටි ත්‍රස්තවාදීහු ප්‍රසිද්ධියේ නොකියති. ඔවුන් සැම විටම පෙනී සිටින්නේ සටන්කර ඊළමක් දිනා ගැනීම වෙනුවෙන්ය. දෙමළ ජනයාට ඔවුන් කියන්නේද එයමය. හමුදා භටයන් වෙත බෝම්බයක් ගැසීමෙන් හෝ සියදිවි නසා ගන්නා බෝම්බ පුපුරුවන්නන් යෙදවීමෙන් හෝ ඊළම දිනා ගැනීමට නොහැකි බව ඔවුන් නොකියන්නේ එසේ කළහොත් ඔවුන්ට තවදුරටත් ත්‍රස්තවාදී කල්ලියට තරුණ තරුණියන් බඳවා ගැනීම ප්‍රශ්නයක් වන බැවින්ය. කොටි සංවිධානයට ත්‍රස්තවාදීන් අවශ්‍ය වෙයි. එසේ අවශ්‍ය වන්නේ සටන් කිරීමට නොව සටන පෙන්වා ඊනියා සාකච්ඡාවෙන් ඊළම දිනා ගැනීමටය. කොටි ත්‍රස්තවාදීන් ඊනියා සාකච්ඡාවලට විරුද්ධ බව පෙන්වමින් බෝම්බ පිපිරවීමෙහි යෙදෙන අතර ඔවුන්ගේ අනුග්‍රාහකයන් වන බටහිර ක්‍රිස්තියානි රටවල් ලංකාණ්ඩුවේ හමුදාවන්ට කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමට ඉඩ නොදෙයි. ඒ සඳහා ඔවුහු විවිධ උපක්‍රම අනුගමනය කරති. එක් පැත්තකින් ඔවුහු ආණ්ඩුවට කෙලින්ම ඒ සඳහා බලපෑම් කරති. එහිදී ඔවුන් ප්‍රයෝජනයට ගන්නේ පිටරට හා මෙරට සිටින ඔවුන්ගේ ඒජන්තයන්ය. මෙරට මේ ඒජන්තයන් නඩත්තු කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන නමින් සංවිධාන රැසක් අටවාගෙන ඇත. රාජ්‍ය නොවන සංවිධාන යනු බටහිර රාජ්‍යවලින් හා දේශපාලන පක්ෂවලින් හා වෙනත් ක්‍රිස්තියානි සංවිධානවලින් යැපෙන සංවිධාන වෙයි. ඒ සංවිධාන පිහිටුවනු ලැබ ඇත්තේ බටහිරයන් විසින් බව ඉතා පැහැදිලිය. මේ සංවිධානවල හා බටහිරයන්ගේ අනුග්‍රහය ලබන ඊනියා සිවිල් සමාජයෙහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ සාමාන්‍ය ජනතාව බටහිරයන්ගේ අවශ්‍යතාව මත මෙහෙයවීමය.

ලංකාව වැනි රටවල රාජ්‍යයට බලපෑම් කිරීම බටහිර රටවලට එතරම් ප්‍රශ්නයක් නොවෙයි. ණය හා ඊනියා ආධාර ඒ සඳහා යොදා ගැනෙන ප්‍රධාන ආයුධ වෙයි. බටහිරයෝ ඒ ඒ රාජ්‍යයන්ට එහිදී විවිධ බලපෑම් ගර්ජන හා තර්ජනද කරති. බටහිරයන්ට එසේ රාජ්‍යවලට කරන බලපෑම් මදිවෙයි. යම් අයුරකින් රාජ්‍යයට විරුද්ධව ජනතාව අතරින්ම සංවිධානයක් බිහිවුවහොත් කරන්නේ කුමක්ද යන ප්‍රශ්නය වෙයි. එහිදී බටහිරයන් මෑතක සිට කරන්නේ මහජන මතය හැසිරවීම සඳහා ආයතන පිහිටුවීමය. මේ ආයතන රාජ්‍ය නොවන සංවිධාන වෙයි. ගමක ළිඳක් කපා හෝ ගමක වෙසෙන්නන්ට ඇඳුම් මහන යන්ත්‍ර ලබාදීමෙන් හෝ රාජ්‍ය නොවන සංවිධානවලට ගම්වාසීන් අවනතකර ගත හැකි යැයි බටහිරයෝ සිතති. එමෙන්ම ඒ වර්ගයේ සංවිධානවලට අමතරව බටහිරයෝ තම මතය රටට ගෙන යෑම සඳහාද සංවිධාන ගොඩනගති. ඊනියා කලා සංවිධාන, සඟරා පළ කිරීමෙන්, සම්මන්ත්‍රණ පැවැත්වීමෙන්, පුස්තකාල පහසුකම් සැපයීමෙන් බහු මාධ්‍ය උපකරණ ආදි විවිධ උපකරණ ලබාදීමෙන් ආදී ලෙස දැනුම බෙදාහරින සංවිධාන බටහිරයන් විසින් මෙරට පිහිටුවනු ලැබ ඇත්තේ ජනතාවට තම මතය දීම සඳහා පමණකි. එහිදී ඇතැම් සංවිධාන එකිනෙකට විරුද්ධව ක්‍රියා කරනු දැකීමටද ඔවුහු කටයුතු කරති. එසේ කටයුතු කිරීමෙන් ජනතාව තුළ ඒ සංවිධාන එකම තැනකින් පාලනය කෙරෙන සංවිධාන නොවේය යන හැඟීමද ඇතිවෙයි.

මෙවැනි සංවිධානවලට කොටුකර ගන්නා පිරිස් බොහෝවිට විශ්‍රාමලත් මාක්ස්වාදීන් වීමද මෙහිදී අමතක කළ නොහැකිය. මේ සංවිධාන මතුපිටින් ගත් කල නව මත, අසාධාරණයට එරෙහිවීම ආදිය වෙනුවෙන් පෙනී සිටියි. එවැනි දේ සඳහා යොමුවන්නන් විශ්‍රාමලත් මහලු මාක්ස්වාදීන්ගෙන් හෝ එවැනි මනස් ඇති තරුණ තරුණියන් අතරින් සොයා ගැනීම අපහසු නොවෙයි. මතවාදී රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරිකයන්ගෙන් වැඩි පිරිසක් එවැනි මනස් ඇති අය වීම පුදුමයක් නොවෙයි. මේ පිරිස කිනම් ප්‍රගතිශීලී යැයි කියා ගන්නා මතයක් දැරුවද

© Prof. Nalin De Silva

අවසාන වශයෙන් සේවය කරන්නේ බටහිරයන්ටය. ඒ අරුතින් ගත් කල මෙරට ඇති භයානකම සංවිධාන වන්නේ මතවාදී රාජ්‍ය නොවන සංවිධානය. මේ සංවිධාන ප්‍රථමයෙන්ම විරුද්ධ වන්නේ ඒ රටේ සංස්කෘතියට හා ඉතිහාසයටය. එය ඊනියා හරවත් ප්‍රගතිශීලී කාර්යයක් ලෙස තරුණයන්ට හඳුන්වා දෙනු ලැබෙයි. මාක්ස්වාදය ද අවසාන වශයෙන් සේවය කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයටය. ඉහත කී සංවිධානද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සේවය කරන දින අනුකාරක සංවිධාන වෙයි. අද මේ සංවිධාන ඔස්සේ ජනමතය දෙමළ ජාතිවාදයට පක්ෂපාත කරවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙයි. බටහිරයෝ සෘජුවම ඒ ඒ රටවල රාජ්‍ය මෙහෙයවන අතර ඊනියා සිවිල් සංවිධාන හා මතවාදී රාජ්‍ය නොවන සංවිධාන හරහා ජනමතය සකස් කිරීමට කටයුතු කරති.

මෙලෙස ජනතාව අතරට බටහිර මතය ගෙනයන එකම මාර්ගය මෙය නොවෙයි. එහිදී සාම්ප්‍රදායිකව යොදාගත් පාසල් හා විශ්වවිද්‍යාල මෙන්ම ජනමාධ්‍යයද බටහිරයන් විසින් යොදාගනු ලැබෙයි. සිංහලයන් දීනයන් බවට පත් කිරීම සඳහා යොදා ගැනෙන සිරසක් නැති නාලිකා මෙරට බොහෝ වෙයි. එහෙත් එවැනි ආයතනවලට වඩා වෙනසක් මතවාදී රාජ්‍ය නොවන සංවිධානවල ඇත්තේ ඒවා ඊනියා වාමාංශික ස්වරූපයක් ගන්නා බැවින්ය. මතවාදී රාජ්‍ය නොවන සංවිධානවලට තමන්ගේම වූ මතයක් නැත. ඔවුන්ට ඇත්තේ බටහිරයන්ගේ යම් මතයකි. ඒ මත දරන්නෝ මූලිකවම දීනයෝ වෙති. මේ සංවිධාන ඔස්සේ බටහිරයෝ හමුදා කලකිරවති. ඊනියා ගැටුම් නිරාකරණය කිරීම පිළිබඳ පාඩම් හමුදාවට කියාදෙති. යුද්ධය කෙරෙහි හමුදා භටයෝ කලකිරවති. ඊනියා ගැටුම් නිරාකරණය කිරීම පිළිබඳ පාඨමාලාද රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ මෙරට විශ්වවිද්‍යාලවලද පැවැත්වෙයි. එහෙත් විශ්වවිද්‍යාලවල ඇතිවන ගැටුම්වලදී මේ පාඨමාලාවල උගන්වන්නන් දැක ගැනීමටද නොහැකිය. විශ්වවිද්‍යාලවල ඇති වන ගැටුම් නිරාකරණය කිරීමට නොහැකි අය එහි ඒ සම්බන්ධ පාඨමාලා පැවැත්වීම හැරෙන්නට හමුදාවටද ගැටුම් නිරාකරණය කියා දෙති. ඔවුන්ට අවශ්‍ය ඊනියා ගැටුම් නිරාකරණයක් හමුදාවට කියාදීම නොව හමුදාව මන්දෝත්සාහී කර යුද්ධය ගැන කලකිරවීමටය.

බටහිරයන්ගේ හා ඔවුන්ගේ අනුගාමිකයන්ගේ තවත් උපක්‍රමයක් වනුයේ අද ඊනියා යුද්ධය දිනීමට හමුදාවට හෝ කොටි සංවිධානයට හෝ නොහැකි යැයි කියමින් ඊනියා සාකච්ඡා අවශ්‍ය බව කියාපෑමය. එලෙස සාකච්ඡා පිළිබඳ මතයක් ජනතාව අතර ඇති කරමින් බටහිරයෝ තමන් වැටුප් හා වෙනත් වරප්‍රසාද දෙන බත්බැළයන් ලවා යුද්ධය වියුක්තව ගෙන එයට විරුද්ධව බොරු මානවහිතවාදී මුහුණුවරකින් ජනතාව අතර මතයක් පතුරුවති. ඒ සඳහා චිත්‍රපට නිපදවීමත් ඒ අධ්‍යක්ෂකවරුන් යැයි කියා ගන්නා නිෂ්පාදක බත්බැළයන්ට තෑගි බෝග දීමත් මෙහි තවත් අංගයක් පමණක් වෙයි. බත්බැළයෝ චිත්‍රපට නිපදවීමේදී හමුදාවට අපහාස කිරීමට හා හමුදාව නින්දාවට පත්කරවීමටද කටයුතු කරති. මේ බත්බැළයන් ප්‍රභාකරන්ගේ කුරිරු බව පෙන්වන එක් චිත්‍රපටයක් හෝ නිපදවා නැත්තේ ඇයි? විසඳීමට ඇති ප්‍රශ්නය යුද්ධය නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අනුග්‍රහය ලබන දෙමළ ජාතිවාදයේ ත්‍රස්තවාදය හා බෙදුම්වාදය බව බත්බැළයෝ නොකියති. තමන්ගේම වූ මතවාදයක් නැති බත්බැළයෝ මහා ආඩම්බරයකින් බටහිරයන්ගේ මතවාද වෙනුවෙන් කඹුරති. කොටි පැරදවීම මහා කාර්යයක් නොවන බව දන්නා හමුදා භටයෝ හා නිලධාරීහු වෙති. බත්බැළයන් කළ යුත්තේ යුද්ධය හමුදාවට භාරදීමය. දෙමළ ජාතිවාදය පරාජය කිරීම සඳහා කෙදිනක හෝ හමුදාව යොදාගත යුතු වෙයි.

සාකච්ඡාවට අකමැති බවක් පෙන්වන කොටි බටහිරයන්ගේ මැදිහත්වීමෙන් බව පෙනෙන්නට සලස්වමින් සාකච්ඡාවට කැමති වෙති. ඉන්පසු සාකච්ඡා ආරම්භ කිරීමට පෙර හෝ සාකච්ඡා පවත්වන අතරතුර හෝ ඊළම සඳහා අවශ්‍ය තව තවත් කොන්දේසි පණවති. ඒ කොන්දේසිවලට ආණ්ඩුවට එකඟවිය හැක්කේ සිංහල ජනයා අතරින් මතුවන විරුද්ධත්වය මර්දනකාරී ලෙස පාගා දැමීමෙනි. එහෙත් මෙතෙක් පැවැති ආණ්ඩුවක් සිංහලයන් මර්දනය කර බටහිරයන්ගේ බලපෑම මත කොටි සංවිධානයේ කොන්දේසිවලට එකඟවීමට උත්සාහයක් ගෙන නැත. බටහිරයෝ ඒ බව දනිති. අද ඔවුන් උත්සාහකරන්නේ කුමක් සඳහාද? සිංහලයන්ට විරුද්ධත්වය පෑමට ඇති සියලු මාවත් නැති කිරීම බටහිරයන්ගේ අරමුණද? ජාතික බලවේග නිහඬ කිරීමේ උපක්‍රමයක් ඔවුහු අනුගමනය කරත්ද? ජාතික බලවේග අද ක්‍රියා කළ යුත්තේ කෙසේද? දේශපාලන බලය ගැනීම සඳහා අවස්ථාවාදීව ජාතික වූවන් හා අනෙක් ජාතික බලවේග අතර වෙනස අපට ඉදිරි කාලයේදී යම් දුරකට හැඳිනගත හැකිද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva